සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

15 | S | I

# පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

# First Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය : .............................................. **ක්‍රිස්තියානි ධර්මය - I** කාලය : පැය 01යි.

වැදගත් :

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට එක් ලකුණ බැගින් ලකුණු 40ක් හිමිවේ.
- අංක 1 - 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

(01) දෙවියන් වහන්සේ දේව පණිවිඩය ජනතාව වෙත ගෙන යාම සඳහා විශේෂයෙන් කැඳවා ගනු ලැබුවේ,
(1) රජවරුන් ය. (2) දිවැසිවරුන් ය.
(3) පූජකවරුන් ය. (4) ලෙවිවරුන් ය.

(02) දුක් කම්කටොළුවලින් පීඩිතව සිටි ජනතාවට දිවැසිවරුන්ගේ දිවැස් වැකි ඇසීමෙන්,
(1) බියක් ඇති විය. (2) අස්වැසිල්ලක් ඇති විය.
(3) බලාපොරොත්තුවක් ඇති විය. (4) කලකිරීමක් ඇති විය.

(03) ''දෙවියන් වහන්සේ අප සමඟයි.'' යන අර්ථය ගෙන දෙන නාමය වන්නේ,
(1) ක්‍රිස්තෝස් ය. (2) මෙසියස් ය.
(3) එම්මානුවෙල් ය. (4) ප්‍රොපේටස් ය.

(04) කිතු උපත දාවිත්ගේ නුවර දාවිත්ගේ පෙළපතින් සිදු වන බවට දිවැස් වැකි ප්‍රකාශ කළ දිවැසිවරයා වන්නේ,
(1) ජෙරමියා ය. (2) ආමොස් ය.
(3) මීකා ය. (4) යෙසායා ය.

(05) යෙසායා දිවැසිවරයාට අනුව ගැලවුම්කරුවාණන් තුළ දක්නට ලැබෙන ප්‍රධාන ගුණාංග දෙකක් වන්නේ,
(1) යුක්තිය හා ධර්මිෂ්ඨකම ය. (2) සාමය හා ප්‍රීති ය.
(3) සාමය හා සංහිඳියාව ය. (4) යුක්තිය හා සංහිඳියාව ය.

(06) ඉශ්‍රායෙල්හි අධිපතියකු වීමට කෙනෙකු පැමිණෙන බව ප්‍රකාශ කළ දිවැසිවරයා වන්නේ,
(1) යෙසායා ය. (2) මලාකි ය.
(3) මීකා ය. (4) ජෙරමියා ය.

(07) රෝම පාලකයින්ගේ දැඩි පීඩනයට ලක් වූ අසරණ ජනතාව නොඉවසිල්ලෙන් බලා සිටියේ,
(1) රෝම අධිරාජ්‍යය බිඳ වැටෙන තුරු ය. (2) රෝමය ගිනි ගන්නා තුරු ය.
(3) පලස්තීන නායකයින් යුද්ධයට යනතුරු ය. (4) සාමය හා විමුක්තිය උදා වන තුරු ය.

(08) ජේසුස් වහන්සේගේ උපත මගින් ඉටු වන්නේ ජනතාව බලාපොරොත්තු වූ,
(1) රජතුමන්ගේ පැමිණීම ය. (2) මෙසියස් වහන්සේගේ පැමිණීම ය.
(3) දිවැසිවරයාණන්ගේ පැමිණීම ය. (4) නායකයාණන්ගේ පැමිණීම ය.

(09) ''මට පෙරටුව ගොස් මාගේ මාර්ගය පිළියෙළ කරන්නා වූ මාගේ දූතයා මට පෙරටුව එවන්නෙමි.'' මෙම ප්‍රකාශයේ මාගේ දූතයා යනුවෙන් හඳුන්වන්නේ,
(1) පාවුල් තුමා ය. (2) ජේසුස් වහන්සේ ය.
(3) ස්නාවක ජොහාන් තුමා ය. (4) පේදුරු තුමා ය.

(10) සමාජ අසාධාරණකම්වලට එරෙහිව ක්‍රියා කිරීමේ දී අප ජීවිතවලට ආදර්ශයට ගත හැකි ජේස්සු වහන්සේ තුළ තිබුණා වූ ගුණාංග වන්නේ,

(1) ඉවසීම, ප්‍රේමය හා සාධාරණකමයි.
(2) දයාව, කරුණාව හා යටහත්කමයි.
(3) නපුර, වෛරය හා තරහවයි.
(4) ලෙන්ගතුකම, දයාව හා ඉවසීමයි.

(11) ස්නාවක ජෙහාන්තුමා ජේසුස් වහන්සේව හඳුන්වා දෙනු ලැබුවේ,

(1) පාපය දුරු කරන දෙවියන් වහන්සේ ලෙස ය.
(2) පව්කරුවන් මුදවාලන්නට පැමිණි තැනැන් වහන්සේ ලෙස ය.
(3) ලොවේ පව් දුරුකන දෙවියන්ගේ බැටළු පෝතකයාණන් ලෙස ය.
(4) ලෝකයේ අඳුර දුරු කරන තැනැන් වහන්සේ ලෙස ය.

(12) ජුදා සමාජයේ වරප්‍රසාද ලත් ඇතැම් පිරිස් ජේසුස් වහන්සේට වරද තබමින් අධිකරණය වෙත පමුණු වන ලැබුවේ,

(1) උන් වහන්සේ වැරදි කළ නිසා ය.
(2) අධිරාජ්‍යයට බදු ගෙවීම තහනම් කළ නිසා ය.
(3) ජනතාව නොමඟ යැවූ නිසා ය.
(4) තම පැවැත්මට තර්ජනයක් වූ නිසා ය.

(13) මරන්න ගෙන යන බැටළුවකු මෙන් ද උගේ ලොම් කපන්නා ඉදිරිපිට ගොළුව සිටින බැටැළුවකු මෙන් ද පිලිප් විසින් එතියෝපීය නපුන්සකයාට පහදා දුන් මෙම පාඨය අයත් ග්‍රන්ථය වන්නේ,

(1) ජෙරමියා ය. (2) මීකා ය. (3) යෙසායා ය. (4) ආමොස් ය.

(14) ජේසුස් වහන්සේ තමන් පිළිබඳව පළ කර තිබුණු අනාවැකි සම්පූර්ණ කරමින් ප්‍රථම දේශනය පවත්වනු ලැබුවේ,

(1) ගලීල මුහුදු වෙරළේ දී ය.
(2) ජෙරුසලම් දේව මාලිගයේ දී ය.
(3) ගෙත්සෙමන උයනේ දී ය.
(4) නාසරෙත් ධර්ම ශාලාවේ දී ය.

(15) සමාජය විසින් ප්‍රතික්ෂේප කළ මුත් ජේසුස් වහන්සේගේ පිළිගැනීමට ලක් වූ කණ්ඩායම වනුයේ,

(1) පරිසිවරුන්, සාකෙවුස්, සද්දුසිවරුන් ය.
(2) පවුකාර ස්ත්‍රිය, සාකෙවුස්, ලාදුරු රෝගීන් ය.
(3) සාකෙවුස්, ලාදුරු රෝගීන්, සද්දුසිවරුන් ය.
(4) ලාදුරු රෝගීන්, පවුකාර ස්ත්‍රිය, විනයධරයන් ය.

(16) ජුදෙව් ජන සමාජයේ විශ්වාසය අනුව ගාබ්‍රියල් දේව දූතයා ගෙන එනු ලබන්නේ,

(1) ශුභාරංචි ය.
(2) ශෝක ආරංචි ය.
(3) අනාවැකි ය.
(4) අනතුරු ඇඟවීම් ය.

(17) ස්නාවක ජොහාන්තුමා බොහෝ දෙනෙකු ස්වාමීන් වහන්සේ වෙත හරවනු ලැබුවේ,

(1) දිවැස් වැකි ප්‍රකාශ කරමින් ය.
(2) මනස්ථාපනයේ බෞතීස්මය ලබාදෙමින් ය.
(3) ජනතාවට නීති දැමීමෙන් ය.
(4) තමන් මෙසියස් බව පවසමින් ය.

(18) තම මහලු වයසේ දීත් දරුවකු ලබාදෙන ලෙස ඉල්ලමින් දෙවියන් වහන්සේට කන්නලව් කළ බැතිමත් යුවළ වන්නේ,

(1) ඊසාක් සහ රෙබෙකා ය.
(2) ජාකොබ් සහ රාකෙල් ය.
(3) සෙකරියස් සහ එළිසබෙත් ය.
(4) ආබ්‍රහම් සහ සාරා ය.

(19) දේව සැලැස්මට අවනත වූ ජොසෙප් එයට දක් වූ යහපත් ප්‍රතිචාර වූයේ,

(1) මරියාණන් තම බිරිඳ ලෙස තම නිවසට කැඳවාගෙන යාම ය.
(2) මරියාණන් ඇගේ නිවසේ රඳවා තැබීම ය.
(3) මරියාණන් ඇගේ දෙමාපියන්ට බාරදීම ය.
(4) මරියාණන් අමතක කර ඇගෙන් වෙන් වී යාම ය.

(20) මරියතුමියගේ සහ එළිසබෙත්තුමියගේ ජීවිත ක්‍රියාවලිය මගින් අපට ඉගෙන ගත හැක්කේ කාලය හා වයස ......

(1) සේවය කිරීමට බාධාවක් නොවන බව ය.
(2) දේව නමස්කාරයට බාධාවක් නොවන බව ය.
(3) එදිනෙදා කටයුතුවලට බාධාවක් නොවන බව ය.
(4) දේව සැලැස්ම ඉටු කිරීමට බාධාවක් නොවන බව ය.

(21) මරියතුමිය වෙත පැමිණි ගාබ්‍රියල් දේව දූතයා දේව පණිවිඩය පැහැදිලි කරමින් ප්‍රකාශ කළේ,

(1) දෙවියන් වහන්සේ ජීවමානයි යනුවෙනි.

(2) දෙවියන් වහන්සේට කළ නොහැකි දෙයක් නැත යනුවෙනි.

(3) දෙවියන් වහන්සේගේ සේවක ගාබ්‍රියල් මමය යනුවෙනි.

(4) ඔබ වනිතාවන් අතර ආශිර්වාද ලද්දීය යනුවෙනි.

(22) ජේසුස් වහන්සේගේ උපතට පෙර ස්නාවක ජොහාන්ගේ උපත සිදුවීමේ දේව සැලැස්ම වන්නේ ජේසුස් වහන්සේගේ,

(1) බෞතීස්මය ස්නාවක ජොහාන් මගින් සිදු කිරීම ය.

(2) පෙරමඟ දූත කාර්යය ස්නාවත ජොහාන් මගින් සිදු කිරීම ය.

(3) වැඩිමහල් සොයුරෙකු ලෙස ස්නාවත ජොහාන් ඇගවීම ය.

(4) සේවය ආරම්භයට ස්නාවක ජෙහාන්ගේ උපදෙස් ලබා ගැනීම ය.

(23) සෙකරියස් පූජක තුමාගේ ප්‍රශංසා ගීතයට අනුව ස්නාවක ජොහාන් තුමාගේ මෙහෙවර වන්නේ,

(1) දේව වචනය දේශනා කිරීම ය.
(2) සමාජ අසාධාරණයට එරෙහිව නැගීසිටීම ය.
(3) ජනතාව මනස්ථාපනයට කැඳවීම ය.
(4) දිවැස්වැකි ප්‍රකාශ කිරීම ය.

(24) ආගමික වත්පිළිවෙත්වල යෙදීමට ධර්මශාලාවල නමස්කාරයට එක්වීමට නොහැකිවීම නිසා සුළු කොට සැලකූ ජන කණ්ඩායම වන්නේ,

(1) රෝගීන් ය.
(2) අන්‍ය ජාතීන් ය.
(3) අයකැමියන් ය.
(4) එඬේරුන් ය.

(25) ජුදෙව් ජනතාව චර්මච්ඡේදන පිළිවෙත ඉටුකිරීම මගින් ඇතුළු වන්නේ,

(1) දෙවියන් වහන්සේට සන්තක වීමකට ය.
(2) දෙවියන් වහන්සේගේ දරු කමකට ය.
(3) දේව ගරුබිය ඇත්තන් වීමට ය.
(4) දේව ආශීර්වාද ලැබූවන් වීමට ය.

(26) තම මරණයට පෙර මෙසියස් වහන්සේ දකින බවට ශුද්ධාත්ම අනාවරණය ලැබ සිටි තැනැත්තා වන්නේ,

(1) මෝසෙස් ය.
(2) ජාකොබ් ය.
(3) සිමියොන් ය.
(4) පාවුල් ය.

(27) තම බලය ආරක්ෂා කර ගැනීම සඳහා ජුදෙව් ආගමික නායකයින් නිරන්තරයෙන් ම

(1) ජනතාවට ආගමික වත්පිළිවෙත් ඉගැන් වූ හ.

(2) රෝම අධිරාජ්‍යයේ අවශ්‍යතා අනුව ක්‍රියා කළ හ.

(3) ධාර්මික ජීවිතයක් ගත කළ හ.

(4) අන් අයගේ සුබ සෙත උදෙසා ක්‍රියා කළ හ.

(28) ස්නාවක ජොහාන් තුමා වෙත පැමිණි ජන කණ්ඩායම් කීපයක් පහත දැක්වේ.

A - පොදු ජනතාව B - අයකැමියන් C - ආරක්ෂක අංශය D - ජුදා ආගමික ජනතාව

අඳනා දෙකක් ඇති අය නැති අයට දෙත්වා....'' කිසිවකුගෙන් කිසිවක් බලහත්කාරයෙන් පැහැර නොගන්න.'' මෙම ප්‍රකාශ අදාළ කණ්ඩායම් වන්නේ,

(1) A හා B ය. (2) D හා C ය. (3) C හා D ය. (4) A හා C ය.

(29) පැරණි ගිවිසුමේ ශුද්ධාත්මයාණන්ගේ වැඩ විසීම ගින්න මගින් සංකේතවත් වූ බවට නිදසුනක් වන්නේ,

(1) නික්මයාම ගමනේ දීය.
(2) මෝසෙස් කැඳවීමේ දී ය.
(3) දවන පූජා පැවැත්වීමේ දී ය.
(4) ජෙරාමියා කැඳවීමේ දී ය.

(30) ජෙරුසලමෙන් ඇත්ව විසූ ජනතාව ආගමික දැනුම ලබා ගැනීම සඳහා රැස්වූයේ
(1) සීන ගෝගයට ය. (2) මුහුදු වෙරළට ය.
(3) මිටියාවතට ය. (4) දේව මාළිගයට ය.

(31) ජේසුස් වහන්සේගේ නාසරෙත් හි ප්‍රකාශයට අදාළ දිවැස් වැකිය ඉශ්‍රායෙල් ජනතාවට මුලින් ම දෙනු ලැබුවේ,
(1) මිසර වහල් යුගයේ දී ය. (2) නික්මයාම ගමනේ දී ය.
(3) පොරොන්දු දේශයට පැමිණි යුගයේ දී ය. (4) බැබිලෝනියේ විප්‍රවාසී යුගයේ දී ය.

(32) ජුදෙව් නීතිය වහලුන් නිදහස් කිරීම අනිවාර්ය කර ඇත්තේ,
(1) වහල් කාලය අවසානයේ දී ය. (2) රජු නියෝගයක් ලබා දීමේ දී ය.
(3) ජුබිලි වසරේ දී ය. (4) සබත් වසරේ දී ය.

(33) ජුදෙව් ජන සමාජය තුළ තෙලින් ආලේප කරමින් කැප කරනු ලැබූ කාර්යයන් වන්නේ,
(1) පූජක, රජ හා විනයදර ය. (2) පූජක, විනයදර හා දිවැසිවර ය.
(3) පූජක, රජ හා දිවැසිවර ය. (4) රජ, දිවැසිවර හා විනයදර ය.

(34) ජේසුස් වහන්සේගේ ජීවිතය හා සේවය සමඟ වැඩි සම්බන්ධතාවයක් ඇති ස්ථානයක් වන්නේ,
(1) නාසරෙත් ධර්ම ශාලාව ය. (2) සීනයි පාළුකර ය.
(3) ගෙත්සෙමනේ මල් උයන ය. (4) ගෙනසෙරෙත් විල ය.

(35) ජේසුස් වහන්සේ සහ සීමොන් පේදුරු සම්බන්ධ සිද්ධීන් කීපයක් පහත දැක්වේ.
A - සීමොන්ගේ ඇදහිල්ල හා විශ්වාසය
B - ජේසුස් වහන්සේගේ හාස්කම් කිරීමේ බලය
C - සීමොන්ගේ නිර්භීතකම
D - ජේසුස් වහන්සේ ශුද්ධවන්තකම හා බලය
''ඔබගේ වචනය නිසා දැල් හෙළමි.'' සීමොන්ගේ මෙම ප්‍රකාශයට අදාළ සිදුවීම් වන්නේ,
(1) A හා D ය. (2) B හා C ය. (3) A හා B ය. (4) C හා D ය.

(36) ජේසුන් වහන්සේ තම ශ්‍රාවකයින් තෝරා ගැනීමේ දී
(1) ධනවත් අයගෙන් තෝරා ගත් සේක.
(2) කිසිදු භේදයක් නොසැලකූ සේක.
(3) දිළින්දන්ගෙන් තෝරා ගත් සේක.
(4) තමන්ට උපකාර කළ අයගෙන් තෝරගත් සේක.

(37) ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් අතරින් උන්වහන්සේ සමඟ නිතර සිටි ශ්‍රාවකයින් වන්නේ,
(1) පේදුරු, ජොහන්, ජාකොබ් ය. (2) පේදුරු, ජොහාන්, ඇන්ඩෲ ය.
(3) ජොහාන්, ජාකොබ්, මතෙව් ය. (4) ජොහාන්, පේදුරු, මතෙව් ය.

(38) A - රට පුරා සුබ අස්න ප්‍රකාශ වීම.
B - ධර්ම දූත සේවය තුළ සාම පැතුම තිබිය යුතු වීම.
C - දුෂ්ඨ ආත්ම යටත් වීම
D - සුබ ආස්න ප්‍රමාද නොවී ප්‍රකාශ කළ යුතු වීම.
ඉහත ප්‍රකාශයන් ගෙන් ධර්ම දූත සේවයේ ප්‍රතිඵලවලට අදාළ ප්‍රකාශයන් වන්නේ,
(1) A හා B ය. (2) B හා C ය. (3) A හා C ය. (4) B හා D ය.

(39) ජේසුස් වහන්සේ උත්ථානය අවිශ්වාස කර පසුව දෙවිඳුන් හා ස්වාමීන් ලෙස පිළිගෙන ප්‍රකාශ කළ ශ්‍රාවකයා වන්නේ,
(1) මතෙව් ය. (2) තෝමස් ය. (3) පේදුරු ය. (4) ජාකොබ් ය.

(40) ''එහෙත් මට වඩා ආනුභාව සම්පන්න උතුමෙක් එන්නේ ය. එතුමන්ගේ පාවහන් පටි මුදන්නටවත් මම නොවටිමි.''
ස්නාවක ජොහන් තුමාගේ මෙම ප්‍රකාශයෙන් කියවෙන්නේ,
(1) ජේසුස් වහන්සේ නිහතමානී බව ය. (2) ස්නාවක ජොහාන් තුමාගේ දුර්වල බව ය.
(3) ජේසුස් වහන්සේගේ දේවත්වය ය. (4) ස්නාවක ජොහාන් තුමාගේ යටහත් පහත් බව ය.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

15 S II

# පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

# First Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය : ............................................ ක්‍රිස්තියානි ධර්මය - II කාලය : පැය 02යි.

වැදගත් :

✳ පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

✳ කෙටි පිළිතුරු ලියන්න.

(01) (i) බලන්න කන්‍යාවක් පිළිසිඳගෙන පුත්‍රයකු බිහි කරන්නී ය. .......... තබන්නීය. (මෙහි හිස්තැන පුරවන්න.) මෙම දිවැස් වැකිය ප්‍රකාශ කළ දිවැසිවරයා කවු ද? (ලකුණු 2)

(ii) කිතු උපත සිදුවන කාලය වන විට ජුදා සමාජයේ පවුකරුවන් ලෙස සලකා නිසි තැනක් ලබා නොදුන් ජන කොටස් 4ක් නම් කරන්න. (ලකුණු 2)

(iii) දේව සැලැස්ම අනුව ජේසුස් වහන්සේ මාංශගත වීම තුළින් ඉටු වූ අරමුණු 2ක් ලියන්න. (ලකුණු 2)

(iv) අභියෝගාත්මක දේශනා මගින් ජනතාව කොටස් අමතමින් ජනාතව තුළ තිබූ දුර්වලතා පෙන්වා දෙන ලද්දේ කවුරුන් විසින් ද? එතුමාගේ සේවකත්වය පිළිබඳ දිවැස් වැකි පැවසූ දිවැසිවරුන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 2)

(v) සෙකරියස්තුමා තුළ තිබූ යහපත් ගුණාංග 2ක් ලියන්න. (ලකුණු 2)

(vi) ගාබ්‍රියල් දේව දූතයා විසින් ස්නාවක ජොහාන්ගේ සේවය පිළිබඳ සෙකරියස් පූජකතුමා වෙත ගෙන එන ලද ප්‍රකාශනයේ ඇතුළත් කරුණු 2ක් ලියන්න. (ලකුණු 2)

(vii) පෞද්ගලික හා සාමූහික ආගමික වාතාවරණයන් ශක්තිමත් කරනු ලබන අද කිතු සසුන තුළ පවතින විවිධ පිළිවෙත් 2ක් නම් කරන්න. (ලකුණු 2)

(viii) ජුදෙව් පාස්කු මංගල්‍යය පවත්වනු ලැබුවේ කුමන සිදුවීමක් සිහිපත් කිරීම සඳහා ද? (ලකුණු 2)

(ix) ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයන් පුහුණු කර බලය පැවරුවේ කුමන කාරණා ඉටු කිරීම සඳහා ද? කරුණු 2ක් ලියන්න. (ලකුණු 2)

(x) (i) ජුදෙව් සමාජයේ තෙලින් ආලේප කළ කොට්ඨාස 2ක් නම් කරන්න.

(ii) තෙලින් ආලේප කිරීමෙන් අර්ථවත් කළේ කුමක් ද? (ලකුණු 2)

(02) (i) ජේසුස් වහන්සේගේ දෙමාපියන් ජේසුන් වහන්සේ සෙවීම සඳහා ජෙරුසලම් මාලිගයට නැවත යන විට ජේසුස් වහන්සේ කුමක් කරමින් සිටියෙහි ද? (ලකුණු 2)

(ii) මරියතුමිය තමන් සෙවූ බව දැක ජේසුන් වහන්සේ පැවැසුයේ කුමක් ද? එයින් අර්ථ ගැන්වෙන දේ රූල් 2න් විස්තර කරන්න. (ලකුණු 2+1)

(iii) මෙම සිදුවීම තුළින් කිතුණු දරුවන් වන අපට ඉගෙන ගත හැකි ආදර්ශ හෝ ඉගැන්වීම් 5ක් ලියන්න. (ලකුණු 5)

(03) (i) ස්නාවක ජොහාන් තුමා දුන් මනස්ථාපනයේ පණිවිඩය ප්‍රතික්ෂේප කළ අයෙක් නම් කරන්න. (ලකුණු 2)

ඔහු ස්නාවත ජොහාන්තුමාට විරුද්ධව ක්‍රියා කළේ කෙසේ ද? (විරුද්ධව කළ ක්‍රියාවක් නම් කරන්න.)

(ii) ස්නාවක ජොහාන් තුමා අනුශාසනා තුළින් ඉගැන්වීම් කළ ජන කොට්ඨාස 3 ක් නම් කරන්න. (ලකුණු 3)

(iii) ස්නාවක ජෙහාන්තුමාගේ අනුශාසනා මගින් අපට ලබාදෙන පණිවිඩ 5 ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

(04) (i) දේව රාජ්‍ය අන්‍යන්ට ද විවෘත බව දැක්වීමට ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ උදාහරණ 2ක් දක්වන්න. (ලකුණු 2)

(ii) ජුදා සමාජයේ මෙන් අප ජීවත් වන සමාජයේ ප්‍රතික්ෂේපයට පත් ජන කොටස් 3ක් නම් කර ඔවුන් ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණක් බැගින් ලියන්න. (ලකුණු 3)

(iii) ජේසුස් වහන්සේ කුමන ප්‍රතික්ෂේපවලට ලක් වුව ද දේව රාජ්‍ය මිහිමත ස්ථාපිත කිරීමට ක්‍රියා කළේ ය. කිතුණු දරුවෙක් වන ඔබට පැමිණෙන අභියෝග හමුවේ දේව රාජ්‍ය ගොඩනැගීමට කළ හැකි කාර්යයන් 5ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

(05) (i) ''වග වලසුන් මැදට බැටලු පැටවුන් යන්නාක් මෙන් මම ඔබ යවමි.'' මෙයින් ගෙන හැර දක්වන අර්ථය කුමක් ද? (ලකුණු 2)

(ii) වත්මන් සමාජයේ දහම් සේවයේ යෙදෙන්නන්ට මුහුණදීමට සිදුවන අභියෝග 3ක් ලියන්න. (ලකුණු 3)

(iii) ''ශ්‍රාවකයන් ලැබූ පුහුණුව ක්‍රිස්තු උත්ථානයෙන් පසුව සභාව ගොඩනැගීමට මහත් ධෛර්යයක් විය.'' මෙම ප්‍රකාශය පිළිබඳ අදහස් රූල් 5කින් විස්තර කරන්න. (ලකුණු 5)

(06) (i) ජේසුන් වහන්සේ ශ්‍රාවකයන්ට හා ධර්මදූතයින් 70 දෙනාට ගෙන නොයන ලෙස පැවසූ දේවල් 2 බැගින් ලියන්න. (ලකුණු 2)

(ii) ධර්ම දූතයන් 70 දෙනාට පැවරූ කාර්යයන් 3ක් ලියන්න. (ලකුණු 3)

(iii) ධර්ම දූත චාරිකාවලින් ඔබ ජීවිතයට වැදගත් වන කරුණු 5ක් දක්වන්න. (ලකුණු 5)

(07) පහත සඳහන් මාතෘකාවලින් දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) දුක් උසුලන සේවකයාණෝ (ලකුණු 5)

(ii) පෙරමග දූත සේවය (ලකුණු 5)

(iii) නාසරෙත් ප්‍රකාශයේ වැදගත්කම (ලකුණු 5)

(iv) කැඳවීම හා ශ්‍රාවකත්වය (ලකුණු 5)